
විසෙල්මියා
රාජධානිය
කතෘ - ලවංශා රත්නයක
පාසල- මහාමායා බාලිකා විදුහල
නිර්මනය කල දිනය- 2026/06/10



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පිදුම

විදුහල්පතිතුමිය,විද්‍යාලයේ ගුරුමණ්ඩලය,මගේ මිතුරියන් හා සහය වූ සියලුදෙනාට හදපිරි සතුටින් පුදමි.

ISBN 978-624-211-489-7

එකෝමත් එක කාලෙක විනී කියලා තරුණ ගෑණු ළමයෙක් හිටියා.එයා කැලෑවලටයි අද්භූත දේවල් වලටයි හරිම උනන්දුයි. දවසක් දා එයා තනියම කැලෑවට යනකොට එයා දැක්කා පුන්චි එළි වගයක් එක දිශාවකට එක පේළියකට තියෙනවා. ඉතිං විනී එයාගේ තියන ආසාවට එයා ඒක පස්සෙන් ගියා.එහෙම යනකොට එයාට හම්බවුණා රාජකීය විදිහට ඇදන් ඉන්න කෙනෙක්.එයා විනීට මෙහෙම කිව්වා." ඔබ ගෙදර ගොස් පරණ පොතක් සොයා ගන්න.එය ඇර බලන්න ."ඒ වෙලාවෙම එයා අතුරුදන් වුණා. විනී ඉක්මනින්ම ගෙදර ගියා.



වීනී ගෙදර හැම තැනම බැලුවා. එහෙම බලනකොට දූවිලි තියෙන පරණ පොතක් හම්බ වුණා.ඒකේ පිටකවරයේ දිලිසෙන අකුරින් ලියලා තිබුණා විසෙල්මියා කියලා.වීනී ඒ පොත ඇරලා බැලුවා.



එතකොට ම වීනී වෙන ලෝකයකට ආවා .එයා ටිකක් අවිදලා බැලුවා. එහෙදි එයා දැක්කා හැම කෙනෙක්ටම වගේ ලෙඩක් හැදිලා තියෙනවා කියලා.එයලා පාරේ ඇද වැටිලා හරිම අමාරුවෙන් හිටියා. එයාලාව දැකපු විනීට දුක හිතුණා. නමුත් විනී තව දුරටත් ඇවිදගෙන ගියා ඇයට තිබුණු බය සහ කුතුහලය නිසා. එතකොට එයා දැක්කා ලොකු මාලිගයක් තියෙනවා.









විනී මාලිගයට ඇතුල් වුණා.එතන සිටි මුරකරුවන් ඇයට මෙහෙම කිව්වා. "විනී කුමරියනි අප ඔබව සාධරයෙන් පිළිගන්නවා විසෙල්මියා රාජදානියට."එතොකොට විනී කිව්වා මුරකරුවන්ට "ඔබලාට වැරදීමක් වෙලා තියෙන්නේ මම සාමාන්‍ය පවුලක ගෑණු ළමයෙක්." මුරකරුවන් ඇයට මෙසේ කියන්නට වුණා."කුමරියනි ඔබගේ මව වන රැජිනියගෙන් විමසා බලන්න.ඇය ඔබට ඇත්ත පැහැදිලි කරාවි."විනී ඇහුවා මුරකරුවන්ගෙන් "ගෙදරට යන්නේ කොහොමද ?"කියලා.මුරකරුවන් පුන්චි පාරක් පෙන්නා "එම පාර දිගේ යන්න." කිව්වා විනීට.ඇය එම පාර දිගේ ගියා.



විනී ගෙදරට ගියපු ගමන් අම්මාගෙන් ඇසුවා"මට ඇත්ත කියන්න.විසෙල්මියා රාජදානිය කුමක්ද අම්මා." විනීගේ අම්මා ඇත්තම විනීට කිව්වා."ඔයාගේ තාත්තා ෆිලන්ටිනා රාජදානිය යටත් කරගන්න සිතාගෙන එම රාජදානිය එක්ක යුද්ධක් පටන් ගත්තා.එහි රජු මායාකාරියකු ලවා විසෙල්මියා රාජදානියට ශාප කළා.ඒ ශාපය නිසා රාජදානියේ හිටිය බොහෝ දෙනා ලෙඩ වුණා.ඔයාගේ තාත්තටත් ලෙඩේ හදුණා.හදුණා.ඒ නිසා ඔයාගේ තාත්තා මියගියා. මම ඔයාව ඒ ලෙඩෙන් බේරගන්න ඔයත් එක්ක මේ ලෝකයට ආවා.



ඔයාගේ  ඇත්ත ස්වරූපය මමම සැගවූවාට ඔයා කුමාරිකාවක් වීමටම උපන් කෙනෙක්.එන්න අපි විසෙල්මියා රාජධානිය බාරගමු. එහි ජනතාවගේ ලෙඩ සුව කරමු."විනී හරි පුදුම වුණා. විනීත් එයාගේ අම්මාත් විසෙල්මියා රාජධානියට නැවතත් ගොස් එම රාජධානිය පලනය කරා. රාජධානියේ ශාපය එකපාරටම

නැතිවුණා. රාජධානියට නැවතත් සාමය උදා වුණා. විනී කුමරියත් රැජිනත් සතුටින් ජීවත් වුණා.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්යය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)